# දහඅට වරිගුව

## මෙල්බන් කප්

මොළය වෙහෙසලා කරන කාර්යයකදි පිරිමින් අභිබවා ගියත් කනාය ශක්තිය මෙහෙවයල කරන දෙයකදි පිරිමින් අභිබවන එක අපහසුයි කියලා තියෙන මිත්‍යාව බොරු කරමින් අවුරුදු 100 කට අධික කාලයකට



පස්සේ මෙල්බන් කප් එක උස්සපු අප්සැට් කාන්තා ජොකියට මෙන්න චූටි මල්ලිගෙ උපහාරය. මෙහෙම දිනුම් වලට මේ ක්‍රීඩාවේ කියන්නෙ අප්සෙට් වින් එකක් කියල. කොහොම කොහොම කිව්වත් අශ්ව රේස් එකකදි පිරිමින් පරදවලා ජය ගන්නවා කියන්නෙ තරගෙට ලී ඉරලා කොට පළලා ජය ගන්නවා වගේ වැඩක්. මේක ලේසි පාසු කෙළියන් නම් නෙවෙයි කියලා තේරුණේ දවසක් දියතලාවෙදි අහම්බෙන් අශ්වයෙකුගේ පිටේ නැගලා ටික දුරක් යන්න ලැබුණ පොට්ට චාන්ස් එකේදි. එදා නම් හිතුණේ රේස් යාම කෙසේ වෙතත් වේලුසුමනලා නන්දිමිත්‍රලා මුන් පිටේ නැගලා කඩු සටන් කළේ කොහමෙද කියලා. පිට උඩ නම් නැග්ගා කියමු. ඊක උඩ ඉඳන් පැයට හැතැක්ම හැට හැත්තෑවක වේගෙන් යනවා කියන්නෙ මාර ගේමක්ම තමයි. කවුරු හරි කියනවා නම් අශ්වයා හොඳ නිසා දිනුවා කියලා ඊක වැරදියි බොස්. හොඳ අස්වයෝ ප්ලේස් වෙලා අප්සෙට් අශ්වයෝ වින් කරන්නෙ ජොකියගේ හොඳ කමින්ම තමයි. ඊකත් එක්තරා ශිල්පයක් තමයි. ශිල්පෙ පොඩ්ඩක් එහා මෙහා වුණොත් බිම තමයි.ඒ බිම වැටීමෙ තරම කොයි වගේද කියලා පෙන්නලා දුන්නේ අපේ ඩී එස් සේනානායක මහත්තයනෙ. උන්නැහේ බිම වැටුණෙ රේස් ගිහිල්ලවත් නෙවෙයි. තවත් හරියටම බලාගන්න ඕනෙ නම් බෙන්හර් වගේ ෆිල්ම් එකක් බැලුව නම් හරි.

ශතකයකට පස්සෙ හරි මේ වගේ තැනත් ලබාගන්න අපේ කාන්තා ජොකියෙකුට පුලුවන් වීම ගැන අපි සතුටුයි. මෙහේ කට්ටියට අරුමයක් නොවුණට අපට නම් මේක විශ්සුමයක් ගේන කාරණයක්. අපේ නංගිලා අක්කලා නැන්දලා මේ වගේ ඉදිරියට එන්න හිතනවා නම් ඊක අපේ සමාජයටත් ලොකු හයියක් වේයි. මෙවන් ජයග්‍රහණයක් බලා ගන්න ඒ කාන්තා අසරුවරියට තිබුණ දැඩි ආත්ම විශ්වාසයටත් ධෛර්යයටත් එය ජයග්‍රහණයක් කරා ගෙන ගිය අධිෂ්ඨානයටත් අපේ ප්‍රණාමය.

## හොරා පොලිස්

යාලු මිත්‍රයෝ එකට එකතු වෙලා කරන දාමරික කම් සටන් සගයෝ එකතු වෙලා කරන තක්කඩිකම් නිතර අහලා පුරුදු අපට තාත්තලා පුතාලා එකතුවෙලා නීතියත් එකක් හැංගි හොරා සෙල්ලම් කිරීම තරමක අමුත්තක් ගෙන දෙන සිදුවීමක්. පුරා අවුරුදු අටක් පොලීසිය සමග කට්ටි පැනපු තාත්තයි පුතයි පසුගිය දවසක කොටු වුණා. මේ දෙන්නගේ ගේම් ගැන නිව්සු වලින් අහනකොට මට මතක් වුණේ ඒ දවස් වල බලපු බටහිර ගොපළු චිත්‍රපටි. අපි ප්‍රබන්ධ වල කියවපු චිත්‍රපටි වල දැකපු දේවල් සැබෑ ලෝකයේ දැකපු කාලය දැන් ඉකුත් වෙලා ගහින්. ලෝකය දැන් කුඩා වෙලා. සන්නිවේදනය නිසා මේක දැන් ගම්මානයක් වෙලා කියලයි කියන්නේ. එහෙම ලෝකෙක අවුරුදු අටක් මංකොල්ලකමින් මිනිසුන් බිය වද්දමින් ගොවිපොල වලට කඩා පනිමින් පොලිසිය සමග කට්ටි පනිනවා කියන්නෙ ලේසි පාසු ගේමක් නෙවෙයි. මං අර මුළින් කිව්වා වගේ තාත්තා කොනකුටයි පුතෙකුටියි මේක ලේසි නැහැ. ඊක ටිකක් වෙනස්. ඒත් අවසානය වෙන්නෙ ප්‍රබන්ධියක වගේ නීතියේ රැහැණට අසුවීමෙන්. දුෂ්ඨයන්ට සදා කල් උරුම ඉරණම ඔවුන්ටත් අත් වෙනවා. මේ සිද්ධියෙදි මම කල්පනා කළේ කාරණා දෙකක් ගැන. එක ඕට්‍රේලියාව කියන්නෙ කොපමණ විශාල රටක්ද යන්න. අනික ලෝකයේ ඉහළම නවීනම තාක්ෂණයෙන් පිරිපුන් ආරක්ෂක අංශයක් තිබෙන ඕස්ට්‍රේලියාව වගේ රටක පොලිසියට මොවුන් අල්ලාගන්න මෙතරම් කලක් ගියේ ඇයිද කියන කාරණය.

ඒ අතරෙම මතක් වුණේ එංගලන්තෙ සුද්දෙක් ඔස්ට්‍රේලියාවෙ පොලිසිය ගැන පපත්තරෙන්ට කියල තිබ්බ පකාශයකුත්



මතක් වුණා.

"ඔස්ට්‍රේලියාවෙ තියෙන්නෙ ට්‍රැෆික් පොලිසියක්. ඒ අය දක්ෂ වාහන වැරදි ගැන හොයන්න විතරයි"

සුද්දගෙ කටේ මසුරමක් කොහොම වෙතත් ස්ටර්ලින් පවුමක් දාන්න වටිනවා කියලයි චූටි මල්ලිට හිතෙන්නෙ.

## මව් සෙසෙහස

අන්තර්ජාලය නොයෙකුත් බහුබූත වලින් පිරිලා තිබුණත් ඉඳහිට කියවන්න හොඳ කතන්දරත් තියෙනවනෙ. පහුගිය දවස් වල වයිරල් වුණ අම්ම අතරමග අතැරදාල ගිය දරුවව බේරගත්ත ජෝර්දානයේ බල්ලගෙ කතාව ඒ වගේ එකක්. ප්‍රබන්ධයක් වගේ පෙනුණත් බල්ලා සහ මිනිසාගේ ඉතිහාසගත සම්බන්ධතාව නිසා එහෙම වෙන්නත් පුලුවන් කියලා හිතනවා. අනෙක් අතින් දාරක ස්නේහය කියන්නෙ සියළු සත්වයනට පොදු කාරණයක්නෙ. ඒත් දැන් නම් ඒ සෙනෙහස සමහර තැන් වලදි විවිධ විදිහට ක්‍රියා කරන බවක් තමයි පේන්නෙ. ඊකනෙ ජෝර්දානෙ අම්මගෙ හිතේ ඇති නොවුණ දරු සෙනෙහල බැල්ලිගෙ හිතේ ඇති වෙලා තියෙන්නෙ. ඔය වෙනස් අත්දැකීම මටත් මේ ළඟදි කිස්බරෝ ෂොපින් සෙන්ටර් එකේදි අත්විඳින්න පුළුවන් වුණා. පහුගිය දවසක අපි සෙන්ටර් එකට ඇතුල්වෙද්දිම වයස අවුරුදු පහක හයක විතර කුඩා දැරියක් තමන්ගෙ අම්මව හොයමින් මහ හඬින් හඬමින් සෙන්ටර් එක පුරා එහෙ මෙහෙ දුවනවා අපි දැක්කා. දරුවගෙ ස්වභාවය දැක්ක අම්මලා කීප දෙනෙක් ඇගෙන් යමක් ඇසීමට තැත් කළත් ඇය කිසිවකු සමග කතා නොකර බෙරිහන් දෙමින් තම මවම සොයමින් හැම තැනද දුව ගියා. ටික වේලාවකදී මේසිද්ධිය බොහෝ දෙනාගේ අවධානයට ලක් වී අම්මලා එක් වී සිකියුරිටි එකට කතා කර නිලධාරියෙක් ගෙන්වා ගත්තා. මේ වන විට විනාඩි 15ක් විතර ගිහින්. දැන් සිකියුරිටි ඒකේ අයත් දරුවා පස්සෙන් ෂොපින් සෙන්ටර් එක පුරාම යනවා. වැඩේ ඉන්ටරෙස්ටින් නිසා මාත් ඒ පස්සෙන්ම යනවා. (අපි ඉතින් හරිම කුතුහලය සපිරි ජාතියක්නෙ) හැමෝම හිටියෙ වික්ෂිප්ත වෙලා. අන්තිමේදි ෂොපින් සෙන්ටර් එකේ



ඈත කෙළවරක සාප්පුවක ඉඳලා එළියට එන දැරියගෙ අම්ම ව දැක්ක දැරිය අඬමින්ම දුව ගිහින් ඇය වැළඳ ගත්තා. දුව නැතිවීම පිළිබඳ කිසිම කලබලයක් ඇගේ හැසිරීමෙ තිබුණෙ නැහැ. ඒ අම්මා දුවව නොසැළකිල්ලෙන් බදාගෙන කොහෙද ගියේ කියලා අහනවා. සිකියුරිටි ඇතුළු හැමෝම ඇගේ නොසැළකිල්ල ගැන දොස් කියද්දි එය සත පහකටවත් ගණන් ගන්නෙ නැතිව දැරියත් සමග තවත් සාප්පුවක් ඇතුළට ගියේ කිසිවකුට ස්තුතියි කියා කියන්නෙවත් නැතිව. හැමෝම එකිනෙකාගේ හිස් වනමින් විසිර ගියී දැන් අපේ ලෝකේ දාරක ස්නේහය එහෙමයි. ඒත් බල්ලෝ තාමත් බලු වෙලා නැහැ.

## බස සහ තැන නොතැන

අද ලියන්න ගත්තම මතක් වෙන්නෙම අපි කලින් උපහාසයට ලක් කරලා හිනාවුණ දැන් ඒ දේම කිසිම අවුලක් නැතිව කරන අපේ පුරුදු ගැනමයි. මේ ඒ වගේ තව එකක්. මේක මේ අපි වගේ සාමාන්‍ය මිනිස්සු නෙවෙයි උගත්තු පවා කියන කතාවක්. ඔබත් දන්වා ඇති සමහර විට. ලෝකෙ කොහෙදි මුණ ගැසුණත් ඉන්දියන් කාරයෝ කතා කරන්නෙ ඔවුන්ගෙ භාෂාවෙන්. රුසියන් කාරයෝ රුසියන් භාෂාවෙන්. චීන අරාබි මෙකී නොකී හැම ජාතියක්ම කතා කරන්නෙ තමන්ගෙ භාෂාවෙන්. ඒත් සිංහලයො



දෙන්නෙක් හමු වුණාම කතා කරන්නෙ ඉංග්‍රීසි භාෂාවෙන්ග මේ කතාව අපි කියන්නෙ පොඩි උපහාසයකුත් එක්ක. සිංහලයාගේ දේශප්‍රේමයේ භාෂා ප්‍රේමයේ දිග පළල ගැන තමයි චෝදනාව එනනෙ. ඒත් මේ චෝදනාව යල් පැන ගිය එකක් කියලා අවබෝධ වුණේ බහුවාර්ගික සමාජයට වැටිලා වැඩ කරන්න ගියාට පස්සෙයි. දැන් අපි වැඩ කරන ස්ථානයේ විවිධ ජාතීන් හිටියත් සියළුම පොදු ස්ථාන වලදිත් දෙදෙනෙකුට වැඩිය සිටින අවස්ථා වලදිත් හැම විටම භාවිතා වෙන්නේ පොදු ඉංග්‍රීසි භාෂාවයි. ඇත්තටම ඊක හොඳ දෙයක්. නිකමට හිතන්න මැක්සිකන් දෙදෙනෙක් හා මා සිටින විටක ඔවුන් දෙදෙනා ස්පාඤ්ඤ භාෂාවෙන් කතා කළොත් මා පත්වන අසීරුතාව. නොදන්නා භාෂාවකින් අන් අය ඉදිරියේ කරන අදහස් හුවමාරුව අසා සිටින අය වරදවා වටහා ගන්නට ඇති ඉඩ වැඩියි අනෙක් අතට එය අශෝභනයි. ඊක මට වැටහුණේ මේ සමාජ ආශ්‍රයට වැටුණාට පස්සෙයි. මගේ සමහර මිත්‍රයෝ කියන්නෙ ඔවුන්ගෙ සේවා ස්ථාන වල පොදු කාමර වලදි අන් අය ඉදිරියේ අන් භාෂාවකින් කතා කළහොත් **F** වචනයෙන් ඔවුන් අමතා ඉංග්‍රීසියෙන් කතා කරන ලෙස සිහිපත් කර දෙන බවයි. මැදිහත්ව සිතා බැලුවොත් එහි ඇති අසාධාරණයක නැහැ. අපට අපේ භාෂාව වටිනා බව ඇත්ත වුණත් එය හැම තැනකදිම භාවිතා කිරීම සුදුසු නැහැ. මේව ගැන කල්පනා කරනකොට තමයි සමහර අය ඉහළින්ම පිළිගන්නා සමහර දේවල් යල් පැන ගිහින් කියලා මට හිතෙන්නෙ. අපට ඉතින් අපේ භාෂාව කතා කරන්නම ඕනෙ නම් පැත්තකට ගිහින් ඒ වැඩේ කරගමු. මං හිතන්නෙ ඕව ගැන පූර්ව අවබෝධයක් තිබුණ නිසා වෙන්න ඇති අර මුලින් කිව් කතාවේ සිංහලයෝ දෙන්නා ඉංග්‍රීසියෙන්ම කතා කරන්න ඇත්තෙ.

## ඔන්න බබෝ බදු එනවා

ජීඑස්ටී බද්ද සියයට 15 දක්වා වැඩි කරන්නට



යනවා කියන කතාව අපේ වැඩ පොළවල මේ දවස් වල කතා බහට ලක්වෙන මාතෘකාවක් වෙලා. සියයට දහයෙන් පටන්ගත්ත ජීඑස්ටී එක මේ විදිහට අනාගතයෙදි ක්‍රම ක්‍රමයෙන් ඉහළ දාන්න දේශපාලකයන්ට පුලුවන් නේද කියන කාරණය ඔය බද්ද හඳුන්වා දුන් මුල් අවදියෙම ඉහළින්ම නැගුණ ප්‍රශ්නයක්. එදා හිටිය අගමැති ජෝන් හොවාඩ් දහ අතේ දිව්රලා කිව්වෙ කවදාවත් එහෙම වෙන්නෙ නැහැ කියලයි. ඒත් අද ඒ කතා බොරු වෙන්නයි පාර කැපෙමින් තිබෙන්නෙ. ජනතාවට බදු ගැසීමෙන් සියලුම ප්‍රශ්න විසඳාගන්න පුලුවන් කියලා හිතන දේශපාලකයන් ඒ පියවර මගින් ජනතාව මත පටවන ජීවන බර ගැන හිතන්නෙම නැහැ. මට නම් මේ වෙලාවෙ මතක් වෙන්නෙ හොවාඩ් සමග ගිවිසුම් ගහලා ජීඑස්ටී එක පාස් කරන්න හොවාඩ්ට අවශ්‍ය ඡන්ද ටික ලබා දුන් ඩිමොක්‍රටික් පක්ෂෙ ඒ කාලෙ හිටපු නායිකාව මැග් ලී. උන්දැ එදා ඒ පාපකර්මයට අතනොගැහුව නම්......

මං
**චූටි මල්ලි**